# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2131/27 - 2019 ජූලි මස 10 වැනි බදාදා - 2019.07.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීම (සංශෝධන) පනතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ගොනු අංකය* : GAL/LAN/ACQUIS/A13/49.
*ඉඩම් අමාත්‍යාංශ අංකය* : 4-3/15/2018/VE/09.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුපිට පත්තුව දකුණ සුළු කොට්ඨාසයේ අංක 64ජී අරන්දර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අරන්දර ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද කෑ 3681 හා 2019.04.10 දිනැති පිඹුරේ කැබලි අංක 1 මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.6942 (අක්කර 04 පර්චස් 29.8) වූ ඉඩම් කොටස.

**කැබලි අක්ෂරය 01 – ඉඩමේ නම: මයිලන්ඩ්ස් වත්ත; හිමිකම් කියන අය: 01. කළමනාකරණ අධ්‍යක්ෂ, කෑගල්ල වැවිලි සමාගම, අංක 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම, 02. සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක සී 82, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07; ප්‍රමාණය: හෙක්. 1.6942.**

*උතුරට*: මාර්ගය; *නැගෙනහිරට*: මාර්ගය සහ කැබලි අංක 2; *දකුණට*: කැබලි අංක 2, අටාලවත්ත බටුපිටිය කොටස සහ කොස්වත්ත කුඹුර; *බටහිරට*: කොස්වත්ත කුඹුර සහ මාර්ගය.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.08.07 වැනි දින පෙ. ව. 10.00 ට ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2019.07.31 වන දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශ්‍යතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්. එම්. සී. සුසන්ත හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
ගලිගමුව.

2019 ජූලි මස 05 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-837

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - G 30488 - 17 (2019/07)     ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.